# අනන්තය



## ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න

ඌවේ ජන්දයෙන් පස්සේ ආණ්ඩුව කිව්ව විශාල ජයක් ලැබුව කියල. ඇත්තටම එක විදියකට බැලුවොත් මිනිස්සු ආණ්ඩුවට ඡන්දෙ දීල තියෙනව. මේක හරියට එදා සාමයක් ගැන බලාපොරොත්තුවෙන් විශාල වශයෙන් චන්ද්‍රිකාට ඡන්දෙ දුන්න වගෙයි. දැන් ඒ ජනතාවම යුද්ධයටත් ඒ වගේම ඡන්දය දෙනව. සිංහල අය පමණක් නෙවෙයි අනෙක් අයත් මේ රැල්ලට අහුවෙලා. 1994 වෙනකොට ජනතාව හිටියේ සාමය වෙනුවෙන් ඉතාම තදින් කැප වුන තැනක. චන්ද්‍රිකාට එදා ඡන්දය දීපු අය සමහරු විශාල උද්ධාමයකින් පෙළපාලිත් ගියා. උතුරේ ජනතාව කොටි සංවිධානයට තද බලපෑමක් ගෙනැවිත් සාම සාකච්ඡාවලට ඇදගෙන ගියා. ඒත් චන්ද්‍රිකා ඒ රැල්ල නිසි ලෙස යොදා ගත්තේ නෑ. අවුරුදු 10 ක් තිස්සේ වැනි වැනීම සිටියා මිසක් කරපු කෙංගෙඩියක් නැති තැනට පත්වුණා. ඇත්තටම සාමය තහවුරු කළේ නෑ. ඊළ’ගට සාමයට විරුද්ධ ජාතිවාදීන් සමඟ එකතුවෙලා ඒ අයට තහවුරු වෙන්න ඉඩ ඇරියා. එදා මේ වැඩපිළිවෙල දියත් කළේ අද ජනාධිපතිවරණයට විරුද්ධව ජේ.වී.පී එකට අත වනන මංගල සමරවීර මහත්තයාමයි. ජනතා විමුක්ති පෙරමුණ දමපු සාම විරෝධී කොන්දේසි උන්නැහෙ පිළිඅරගෙන ඒ අයට ලොකු බලයක් දීල ආණ්ඩුවක් හදල සාමය ගැන කථාව මුළුමණින්ම මකල දැම්මා. වික්‍රමසිංහ මහත්තයා සාමය වෙනුවෙන් ගත්ත වැඩපිළිවෙලත් යටවෙලා ගියා. සුනාමිය වෙනුවෙන් හදපු එකඟතාවයවත් ක්‍රියාත්මක කරගන්නත් මේ නිසාම බැරි වුණා. මෙන්න මේ විදියට සාමයට දීපු ඡන්ද වරම බාල්දු කරලා, බාල්දු කරලා, කණපිට හැරෙව්වේ මේ නායකයොමයි. අන්තිමට ජාතිවාදී නායකයෝ චන්ද්‍රිකා බලය ක්‍රියාත්මක නොකළ බිබික්කමක් හැටියට හඳුන්වලා, ජාතිවාදී පැත්තෙන් බලය තහවුරු කරන තැනට ආවා. මේ විදියට 1994 සාමය වෙනුවෙන් ඇති වුණ ජනතා රැල්ල මුළුමණින්ම කණපිට පෙරළලා 2005 වෙනකොට යුදවාදී ජාතිවාදී රැල්ලක් ඇති වෙන තැනට මග පෑදුවේ එදා පාලනය කළ නායකයෝමයි. ඒ නිසා ඌවේදී මේ විදියට ඡන්දය දීම ගැන ජනතාවට දොස් කියන්න බෑ. විශේෂයෙන්ම සිංහල ජනතාව යුද්ධය මගින් සාමය ඇති වුණා කියලා හිතන තැනට පත් කළා. සාම සාකච්ඡාවලට බැරි වුණ දෙයක් මේ මගින් කළා කියල ඔවුන් හිතෙනව.

**එදා ශ්‍රීලනිප හා යූඇන්පී අතර තිබුණ වෙනස අද නෑ. ඇත්තටම මහින්ද පරණ යූඇන්පී කාරයෝ වගේ හින් නූලෙන් වැඩ කරන අයෙක්. හැම පැත්තම නලවමින් තමන්ගේ වැඩේ කරගන්න අතර, ගෝලීය ධනවාදයේ හෙංචයියෙක් වීම අමාරු කාරියක්. මහින්ද ඒ වැඩේ නියමෙට කරගෙන යන නිසා යූ.ඇන්.පී.යට ඒ ප්‍රතිපත්ති උඩ පෙනී හිටින්න බෑ. පක්ෂය තුළ යම් කොටසක් හදන්නේ කරූ ජයසූරිය ඉස්සරහට දමල සිංහල ජාතිවාදයෙන්ම මහින්දට ආපහු ගේම් එක දෙන්න. ඒක ඒ තරම් වලංගු නෑ.**

ඒ වුණත් ප්‍රශ්න විසඳිලා නෑ, බලය බෙදීමක් සැබැවින්ම ඇති කළ යුතුයි කියන එක ටික ටික එළියට එනකොට නැවත අළුත් විදියකට ජනතාව හිතන්න පටන් ගනීවි. එහෙම නැතිව බඩගින්න තිබුණ කියල ජනතාව නිකම්ම පාරට බහින්නේ නෑ.

අද වෙනකොට මහින්ද පෙන්වල තියෙනව තමන් ලෝක ධනපති සමාජයට ගැලපෙන පුද්ගලයෙක් වග. ඇත්තටම ලෝකය පුරාම පරණ ජනතාවාදීන් එක්කෝ හියු-ගෝ චාවේස් වගේ රැඩිකල් වෙලා. නැත්නම් ඉංදියාවේ සෝනියා වගේ දකුණටම ගිහින්. පරණ ජනතාවාදය අද නෑ. එක්සත් ජාතික පක්ෂයට දැන් විකල්පය වෙන්න බැරි ඒ අයගේ වැඩපිළිවෙල දැන් මුළුමණින්ම මහින්ද චින්තනයට ඇතුල් වෙලා නිසයි. මහින්ද යුද්ධයට ගියෙත් ගෝලීය බලවතුන්, විශේෂයෙන්ම ඉංදියාවේ මන්මෝන්සිං කියපු විදියටයි. ඒ උදවියත් හැම අතින්ම සහයෝගය දුන්න විතරක් නෙවෙයි, විපක්ෂයේ වික්‍රමසිංහටත් උපදෙස් දුන්නේ මහින්ද සමඟ එකට යන ලෙසයි. එදා ශ්‍රීලනිප හා යූඇන්පී අතර තිබුණ වෙනස අද නෑ. ඇත්තටම මහින්ද පරණ යූඇන්පී කාරයෝ වගේ හින් නූලෙන් වැඩ කරන අයෙක්. හැම පැත්තම නලවමින් තමන්ගේ වැඩේ කරගන්න අතර, ගෝලීය ධනවාදයේ හෙංචයියෙක් වීම අමාරු කාරියක්. මහින්ද ඒ වැඩේ නියමෙට කරගෙන යන නිසා යූ.ඇන්.පී.යට ඒ ප්‍රතිපත්ති උඩ පෙනී හිටින්න බෑ. පක්ෂය තුළ යම් කොටසක් හදන්නේ කරූ ජයසූරිය ඉස්සරහට දමල සිංහල ජාතිවාදයෙන්ම මහින්දට ආපහු ගේම් එක දෙන්න. ඒක ඒ තරම් වලංගු නෑ. මොකද? කරූ ජයසූරිය යු.ඇන්.පී. ය අත්හැරලා ආණ්ඩුවේ ලොකු ඇමතිවරයෙක් හැටියට හුඟක් කල් හිටියා. ඊළඟට එක පාරටම එළියට ආවේ මහින්ද එක්ක ගෝරි දාගෙන. මහින්ද කුණුහබ්බෙන් බැණල දේශපාලන ෂොට් දෙකක් දුන්න කියලයි ආරංචිය. ඒ විදියට මහින්දගෙන් බැට කාල නෝන්ජල් වෙලා ඇවිත් යූ.ඇන්.පී.යේ නායකයා හැටියට පිළිගැනීමක් ලබා ගත හැකිද?

මේ අනුව මේ මොහොතේ මහින්දට ඇති විකල්පයක් නෑ. ධනපති කඳවුරු තුළින් අද තියෙන තත්වය බැලුවහම විකල්පයක් ගොඩනැගෙන්න අමාරුයි. ඞඞනිදහසේ වේදිකාවඞඞ හැටියට නිදහස් ධනපති විකල්පයක් ගොඩනැගීමට උත්සාහ කළත්, කරූ ජයසූරිය මැද්දේ එල්ල ගෙන ඒ වගේ වැඩක් හරි යන්නේ නැති බව කුරුණෑගලින් ඔප්පු වුණා. කරූ ජයසූරිය වෙනුවට දැන් ආපහු ආණ්ඩුවට විරුද්ධ වූවෙක් හැටියට පිළිගැනීමක් තිබෙන වික්‍රමසිහංව දාල තියෙනව. ඒ වුණත් ඔහොම අවුල් වෙච්ච මහින්දට අභියෝගයක් ගොඩනගන්න පුළුවන් කියල මට නම් හිතන්න අමාරුයි. කොහොමටත් ඉදිරි කාලයේ ඇතිවන ජනතා විරෝධයන් තුළින් තමා අලුත් නායකත්වයක් ඇතිවෙන්න පුළුවන්. 28 වැනිදා ඒ වගේ පුළුල් අරගලයක ලකුණු මතු වුණා. ජාත්‍යන්තරවත් මෙයට රුකුළක් ඇති වුණා කියල ආරංචි මර්ග කියනව. ධනපති සංවර්ධනය දෙසට ලොකු උදවිය හිස යොමු කරන කොට ලොකු ලොකු සාද ඔවුනුත් පවත්වාවි. එතකොට පහළින් ඉන්න දුප්පත් වැඩකරන ජනතාවගෙන් තමා ඇත්ත විරෝධයක් ඇතිවෙන්නේ. විශේෂයෙන් පඩිය හා උසස්වීම් ගැන, රැකියා ගැන ඇති වන හඬ තුළින් අපට යම් බලවේගයක් ගොඩනගන්න පුළුවන් නම් හොඳයි. එතැනයි නියම අභියෝගය මතු වෙන්න පුළුවන් තැන. දැනටමත් විදුලි බල මණ්ඩලය, සෞඛ්‍යය, පුද්ගලික අංශය යන ක්ෂෙත්‍රවල සටන් ආරම්භ වෙලා තියෙනව. ඒවා නිකම්ම සිංහනාදය තුළින් යට කරන්න පුළුවන් වෙන එකක් නෑ. වමේ මුළු අවධානය ජාතිවාදීන් පරදා මේ නැගිටීම් අතට ගන්න දැම්මොත් හොඳයි.




